# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## රබර් පාලන (සංශෝධන)

**රබර් පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා විසින්
2025 ජූලි මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 මැයි මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[**26** වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (436 වන අධිකාරය වූ) රබර් පාලන පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ''පාලක'' සහ ''රබර් පාලක'' යන යෙදුම් වෙනුවට ''අධ්‍යක්ෂ-ජනරාල්'' යන යෙදුම ප්‍රතියෝජනය කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, එය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන කොටසේ ''රබර් පාලක අරමුදල'' සහ ''රබර් උපදේශක මණ්ඩලය'' යන ශීර්ෂය ඉවත් කරනු ලබන අතර, ''රබර් උපදේශක මණ්ඩලය'' යන නව ශීර්ෂය ඇතුළත් කරනු ලැබේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36, 37, 38, 39, 39අ සහ 50 යන වගන්ති ඉවත් කරනු ලබන අතර එය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ''පාලක'' යන යෙදුම සඳහා දැනට පවත්නා අර්ථ නිරූපණය ඉවත් කර ''අධ්‍යක්ෂ ජනරාල්'' යන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම වේ.

එල්.ඩී.-ඕ 31/2022

## රබර් පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2025 අංක    දරන රබර් පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*436 වන අධිකාරයට සිදු කරනු ලබන පොදු සංශෝධනය*

**2.** (1) (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (436 වන අධිකාරය වූ) රබර් පාලන පනත, එහි "පාලක" සහ "රබර් පාලක" යන වචන යෙදෙන සෑම ස්ථානයක ම ඒ වචන වෙනුවට, "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

(2) වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක, ආකෘති පත්‍රයක, වෙනත් සාධන පත්‍රයක හෝ ලේඛනයක "පාලක" සහ "රබර් පාලක" සම්බන්ධයෙන් සිදු කරනු ලබන සෑම සඳහන් කිරීමක් ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඊට පසුව "රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා" සම්බන්ධයෙන් සිදු කරනු ලබන සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගනු ලැබිය යුතු ය.

*ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26 වන වගන්තිය ඉවත් කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියෙහි VI වන කොටසෙහි ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි "VI වන කොටස" යන වචන සහ ඉලක්කම්වලට ඉක්බිතිව ම දැක්වෙන ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:-

"රබර් උපදේශක මණ්ඩලය".

PL 15358 - 475(2025/07)

*ප්‍රධාන ප්‍රඥප්තියෙහි 36, 37, 38, 39, 39අ සහ 50 වන වගන්ති ඉවත් කිරීම*

**5.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 36, 37, 38, 39, 39අ සහ 50 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියෙහි 52 වන වගන්තිය සංශෝධනය කිරීම*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 52 වන වගන්තිය, එහි “පාලක” යන්නෙහි අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> ““අධ්‍යක්ෂ-ජනරාල්වරයා” යන්නෙන්, මේ පනත යටතේ පත් කරන ලද හෝ පත් කරන ලද බවට සලකනු ලබන, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;”.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.